දරුවන් උදෙසා
බයිබලයක්



# දෙවියන්වහන්සේ විසින් එවූ මනුෂ්‍යයා

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

එක් දිනක් දේව මන්දිරය ඇතුළත මහළු පූජකයෙක් සුවඳ දුම් දල්වමින් සිටියේය. ඔහුගේ නම සෙකරියස් විය. පිටත මිනිස්සු යාච්ඤා කරමින් සිටියෝය. එක්වරම සෙකරියස් වෙව්ලන්නට වූයේය.



දේව දූතයෙක් පැමිණියේය. “බිය වන්න එපා” ඔහු කීවේය.
“දෙවියන්වහන්සේ මා එවූ සේක. ඔබේ බිරිඳ පුතෙකු
ලබන්නීය. ඔහුට ජොහාන් යන නම තබන්න. ඔහු උපතේ
පටන්ම ශුද්ධාත්ම බලයෙන් පිරෙනු ඇත.
ඔහු බොහෝ මිනිසුන් දෙවියන්
වහන්සේ වෙත හරවනු ඇත”.



“අපිට කතා කරන්න සෙකරියස්” පිටත සිටි මිනිසුන්ට
ප්‍රහේළිකාවක් විය. ගාබ්‍රියෙල් දේවදූතයා “දරුවා උපදින
තෙක් සෙකරියස්ට කතා කරන්නට
නොහැකියැ” යි ඔහුට කී බව ඒ මිනිසුන්
දැනසිටියේ නැත. දෙවියන් වහන්සේ
ගෙන ආ පණිවිඩය විශ්වාස නොකළ
නිසා සෙකරියස්ට එසේ සිදුවිය.
“දරුවෙකු ලබන්නට තම
බිරිඳ මහළු වැඩියැ”
යි ඔහු සිතුවේය.



සෙකරියස් ඔහුගේ නිවසේදී
දේවදූතයා පැවසූ සියල්ල ලියුවේය.
ඔහුගේ බිරිඳ, එළිසබෙත් පුදුම
වූවාය. ඔවුන් දෙදෙනා නිතරම
දරුවෙකු වෙනුවෙන් යාච්ඤා
කළෝය. එය දැන් සිදුවේවිද?





ඉක්මනින්ම
එළිසබෙත් තමන්ට
දරුවෙකු ලැබෙන්න
යන බව
දැනගත්තාය. ඇය
දෙවියන්වහන්සේට
ප්‍රශංසා කළාය.
එක් දිනක්,
එළිසබෙත් ගේ
ඥාති වන මරියා
ඇය බලන්නට
ආවාය. මරියාද
දරුවෙකු ලබන්නට
සිටියාය.



මරියා පැමිණි
මොහොතේ
එළිසබෙත් හට,
ඇයගේ කුසේ හිඳිනා
දරුවා දඟලනු දැනුනි.
එළිසබෙත් ශුද්ධාත්ම
බලයෙන් පිරුණාය.
මරියා ගේ කුසේ
හිඳිනා දරුවා ස්වාමි වූ
ජේසුස් ක්‍රිස්තුස් බව
ඇය දැනගත්තාය.
කාන්තාවන් දෙදෙනාම
එක්ව ප්‍රීතියෙන්
දෙවියන් වහන්සේට
ප්‍රශංසා කළෝය.

දෙවියන් වහන්සේ පොරොන්දු වූ විදියටම එළිසබෙත් ගේ
දරුවා ඉපදුනේය. “ඔහුගේ පියාගේ නම විදියටම ඔහුටත්
සෙකරියස් කියමුයැ” යි අනෙක් පූජකවරු
පැවසුවෝය. සෙකරියස් හට දෙවියන්
වහන්සේගේ අණ මතක් විය.
“නැහැ, දරුවාගේ නම ජොහාන්”
ලෙස ඔහු ලියුවේය. එවිටම
ඔහුගේ කටහඬ නැවත
ලැබිණි. එවිට ඔහු
දෙවියන්වහන්සේට
ප්‍රශංසා කළේය.



ජොහාන් වයසින් වැඩෙද්දී ඔහු දෙවියන් වහන්සේගේ උතුම් මනුෂ්‍යයෙක් වූ එළියා මෙන් වූයේය. ජොහාන් මිනිසුන්ට කතා කරමින් මෙසියස් වහන්සේ ඉක්මනින් ඔවුන්ට ආශීර්වාද කරන්නට එන බව කීවේය. ජුදෙව් නායකයන් හට ජොහාන් “පසුතැවිලි වන්න, පව් කිරීම නවත්වන්නයැ” යි කී නිසා ඔවුහු ජොහාන්ට වෛර කළෝය. ඔවුන්ට තමන්ගේ පාප ගැන අසා දැනගන්නට අවශ්‍ය නොවීය.



මිනිසුන් ඔහු ස්නාවක ජොහාන් ලෙස හැඳින්වූහ. ඒ, ඔහු මිනිසුන් ජලයේ ගිල්වා බව්තීස්ම කරමින් ඔවුන්ගේ පව් වලට පසුතැවිලි විය යුතු බව පෙන්වා දුන් බැවිනි. එක් දිනක් ජේසුස් වහන්සේ බව්තීස්මය ලබන පිණිස ජොහාන් වෙත ආ සේක. ජොහාන් ඊට අකමැතිවී “ඔබයි මාව බව්තීස්ම කළ යුත්තේ” යනුවෙන් පැවසීය. නමුත් ජේසුස් වහන්සේ කතා කරමින් “එය එසේ වන්නට ඉඩ හරින්නයැ” යි කී සේක. ජොහාන් උන්වහන්සේ බව්තීස්ම කළේය.



ජේසුස් වහන්සේගේ
බව්තීස්මයෙන් පසු
උන්වහන්සේ මතට
ශුද්ධාත්මයාණන්
වහන්සේ පරෙවියෙකු ගේ
රූපයෙන් පැමිණි බව
ජොහාන් දුටුවේය. මෙය
දෙවියන් වහන්සේ ගෙන්
වූ ලකුණකි. ජේසුස්
වහන්සේ දෙවියන්
වහන්සේගේ පුත්‍රයා බව
ජොහාන් දැන සිටියේය.
ඔහු, ජේසුස් වහන්සේ
“ලෝකයේ පාපය ඉවත්
කරන දෙවියන් වහන්සේ
ගේ බැටළු පැටවා” ලෙස
නම් කළේය.



ජොහාන් බොහෝ මිනිසුන් දෙවියන් වහන්සේ වෙතට ගෙන ආවේය. නමුත් හෙරෝද් නම් දුෂ්ඨ පාලකයා ජොහාන් සිරගත කළේය. “හෙරෝදියස්, එනම් ඔබේ සහෝදරයාගේ බිරිඳ, ඔබේ



බිරිඳ ලෙස තබාගැනීම පාපයක්යැ” යි ජොහාන් හෙරෝද් හට කීවේය. හෙරෝද් ඒ කී දේ ඇත්තක් බව දැන සිටියේය. ජොහාන් දෙවියන් වහන්සේගේ සේවකයා බවත් යුක්ති ගරුක ශුද්ධ තැනැත්තෙකු බවත් ඔහු දැන සිටියේය. නමුත් ඔහුට පව් කිරීම නවත්වන්න අවශ්‍ය නොවීය. නමුත් ජොහාන් ද සිරගතව සිටියත් පාපයට විරුද්ධව දේශනා කිරීම නතර කළේ නැත.

හෙරෝද් ගේ උපන් දිනය දවසේදී ඔහු
මහත් සාදයක් පැවැත්වීය. හෙරෝදියස්
ගේ දුව ඔහු වෙනුවෙන් නටා ඔහු සතුටු
කළාය. “ඔබට අවශ්‍ය ඕනෑම දෙයක්
මම දෙන්නෙමි, අවශ්‍ය නම් මාගේ
රාජධානියෙන් බාගයක් වුවත්
දෙන්නෙමි” යි හෙරෝද් ඇයට
පොරොන්දු වූයේය.





“මම කුමක් ඉල්ලන්නද?” දියණිය කල්පනා කළාය. ජොහාන් හට වෛර කළ ඇයගේ නපුරු මව ඇය ඉල්ලිය යුතු දේ කීවාය. ඒ ඉල්ලීම ඉතා භයානක එකකි!



“ස්නාවක ජොහාන් ගේ හිස
තැටියක දමා මට ගෙනත් දෙන්නයැ”
යි ගැහැණු ළමයා කීවාය. හෙරෝද්
ඔහු විසින් දුන් පොරොන්දුව ගැන
දුක් වුනත්, ආඩම්බරකම නිසා එය
කඩන්නට අකමැති විය. “ජොහාන්
ගේ හිස කපා මට ගෙනෙන්නයැ”
යි හෙරෝද් අණ කළේය. ඔහුගේ
සොල්දාදුවෝ ඔහුට
කීකරු වූහ.

දෙවියන් වහන්සේ ගේ නිර්භීත සහ
විශ්වාසවන්ත සේවකයා වූ ජොහාන්
ගේ සිරුර ඔහුගේ මිතුරන් විසින්
භූමදානය කිරීම ඉතා කණගාටුදායක
විය. දෙවියන්වහන්සේ වෙනුවෙන්
ජොහාන් කළ සේවය දැන්
නිම විය. ඔවුන්ගේ දුකේදී
ජේසුස් වහන්සේට
ඔවුන්ව සනසන්න
පුළුවන් බව
සමහරවිට ඔවුන්
දැන සිටියා විය හැක.



දෙවියන්වහන්සේ විසින් එවූ මනුෂ්‍යයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මාර්ක් 6, ශු. ලූක් 1, 3

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)